සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

7 ශ්‍රේණිය
Grade 7

ඉතිහාසය I හා II පත්‍රය
History Paper I & II

පැය දෙකයි
Two Hour

නම/විභාග අංකය :- ..................................................................................

සැලකිය යුතුය.

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

I කොටස

- ප්‍රශ්න අංක 1-5 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) සෙල්ලිපි වල හේන් හඳුන්වා ඇත්තේ
   I. සේන් නමිනි  II. සාලි නමිනි
   III. පිටබිම් නමිනි  IV වපිහමික නමිනි

2) පස් ගෝ යටතට අයත් නොවන්නේ
   I. කිරි  II. එඬරු
   III. දී කිරි  IV. මෝරු

3) අනුරාධපුර රාජධානිය බිඳ වැටුනේ මෙම රජතුමාගේ කාලයේ ය.
   I. පස්වන මිහිඳු රජු  II. බුද්ධදාස රජු
   III. පළමුවන සේන රජු  IV. පළමුවන උදය රජු

4) පළමුවන සේන රජුගේ සමයේ මෙරට ආක්‍රමණ කළ පාණ්ඩ්‍ය රජු වන්නේ
   I. දෙවන වරගුණවර්මන්  II. ශ්‍රී ජයගෝප මහාරාජ
   III. රාජේන්ද්‍ර රජු  IV. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ

5) පොළොන්නරු යුගයේ මුල් ම රජතුමා වන්නේ
   I. මහා පරාක්‍රමබාහු රජුය  II. පණ්ඩුකාභය රජුය
   III. පළමුවන විජයබාහු රජුය  IV. මානවම්ම රජුය

- අංක 6-10 දක්වා ප්‍රශ්න වලට වරහන් තුළින් නිවැරදි පිළිතුරු තෝරා හිස්තැනෙහි ලියන්න.

6) අනුරාධපුර රාජධානි සමයේ පාණ්ඩ්‍ය ආක්‍රමණය මෙහෙයවා ජයගත් සෙනෙවියා පිළිබඳව.......................................................... සඳහන් වේ.
(ඉරිපින්නියාව සෙලිලිපියේ, වේවැල් කැටිය සෙල්ලිපියේ, මිහින්තලේ පුවරු ලිපියේ )

7) අනුරාධපුර රාජධානි සමයේ ඇතුන් පිළබඳ කාර්යාංශයේ ප්‍රධානියා හැඳින්වූයේ......................................................... නමිනි.
(රටිය, අති අදික, අශ අදෙක)

8) අනුරාධපුර යුගයේ රජකළ ............................................රජු අන්ධයින් හා රෝගීන් සඳහා ආරෝග්‍යශාලා හා දානශාලා පිහිටුවා තිබේ.
(පළමුවන උපතිස්ස, බුද්ධදාස,දෙවන සේන)

9) දකුණු ඉන්දියාවේ නැගෙනහිර වෙරළ ආසන්නයේ ලංකාවට ඉතා සමීපව .............................................රාජ්‍ය පිහිටා තිබේ. (චෝළ, පල්ලව, පාණ්ඩ්‍ය)

10) පැරණි හින්දු පොත්පත්වල උපතේදී සිදු කළ යුතු සිරිත්විරිත් ............................................ලෙස හඳුන්වා ඇත. (නාමකරණ, ජාතකර්ම, විද්‍යාරම්භ)

- අංක 11-15 දක්වා ප්‍රකාශ හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද හිස්තැනෙහි යොදන්න.

11) දොරමඩලාව යනු ගොවීන් ජීවත් වූ ගම්මානයකි. (..............)
12) අනුරාධපුර යුගයේ පාලන කටයුතු වලදී මෙන්ම අයබදු පැනවීමේ දී ද රජවරුන්ට "පෙර සිරිතට" අනුව ක්‍රියා කිරීමට සිදු විය. (..............)
13) දකුණු ඉන්දීය රාජ්‍යයක් වන පල්ලව රාජ්‍යයේ අගනුවර තන්ජෝරයයි. (..............)
14) විජයබාහු රජුට ඔහුගේ කුඩා කාලයේ සිට උපකාර කල බුද්ධරාජ සෙන්පති සින්නාරු බිම් බුදල්නා යනුවෙන් හඳුන්වනු ලැබේ. (..............)
15) පළමුවන විජයබාහු රජුගේ උසස් ගුණාංග පිළිබඳව පනාකඩුව තඹ සන්නසේ සඳහන් වේ. (..............)

- අංක 16-20 දක්වා ඇති ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

16) තෝනිගල ශිලා ලිපියෙහි අකල හස ලෙස හඳුන්වා ඇත්තේ කුමන කන්නය ද? . ......................................
17) අතීතයේ පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියතු ශිල්පින් හැඳින්වූ නම කුමක්ද? . ......................................
18) තෝපා වැව හා දුඹුටුළු වැව ඒකාබද්ධ කොට තැනූ ජලාශය කුමක්ද? : ......................................
19) ලාක්ෂා කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සකසා ගන්නේ කෘමියෙකුගේ ශ්‍රාවයෙනි.එම කෘමියා වසන ශාඛය කුමක්ද? . ......................................
20) ලෝක උරුම නම් කිරීමේ හා ඒවා රැකගැනීමේ කාර්ය පැවරී ඇත්තේ කුමන සංවිධානයට ද? . ......................................

(ලකුණු 2 x 20= 40)

## II කොටස

- තෝරාගත් ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

1) i. අතීතයේ හේන් වල වගාකල ඇල් වී වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. පහත යෙදුම්වල තේරුම ලියන්න.

a. නවදැලි හේන

b. ගිනියාතිකාව

c. සී සෑම

d. ගොයම් මැඩීම (ලකුණු 4)

iii. ගවයාගෙන් ලබාගත හැකි ප්‍රයෝජන තුනක් දක්වා එකක් විස්තර කරන්න (ලකුණු 5)

2) i. අතීතයේ ලංකාවේ නගරවල වෙළඳසැල්වල විකුණූ භාණ්ඩ තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

ii. බදුලු ටැම් ලිපියේ සඳහන් වෙළඳපොල පාලනයට අදාල නීතිරීති හතර ලියන්න. (ලකුණු 4)

iii. ලංකාවට විදේශ වෙළඳාමේ දී වැදගත් වූ වරායන් තුනක් දක්වා වරායකින් සිදුවන කාර්යයන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

3) i. ලංකාව පාලනය කළ මානවම්ම පෙළපතේ රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

ii. මානවම්ම රජු බලයට පැමිණීමට පෙර මෙරට දේශපාලන ක්ෂේත්‍රයේ කැපී පෙනුන ලක්ෂණ හතර ලියන්න (ලකුණු 4)

iii. මානවම්ම රජුගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණ දෙක දක්වා ඒ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 5)

4) i. පාණ්ඩ්‍ය ආක්‍රමණයෙන් පසු පළවන සේන රජු ලංකාවේ නව ඉදිකිරීම් පැරණි විහාරාරාම ආශ්‍රිතව සිදුකර ඇත.එම පැරණි විහාරාරාම තුන නම් කරන්න. (ලකුණු 3)

ii. අනුරාධපුර යුගයේදී රජකම උරුම වීමේ ක්‍රම දෙක දක්වා ඒවාට උදාහරණ එක බැගින් ලියන්න. (ලකුණු 4)

iii. මිහින්තලේ පුවරු ලිපියට අනුව මූල්‍ය කළමණාකරණය පිළිබඳ වගන්ති 5ක් ලියන්න. (ලකුණු 5)

5) i. අනුරාධපුර යුගයේදී අගනුවරට බැහැරින් වෙනම පරිපාලන නිලධාරින් යටතේ පැවති ප්‍රදේශ තුන නම් කරන්න. (ලකුණු 3)

ii. මධ්‍ය පාලනයේ ඉහලම තැනැත්තා වූ රජුට අයත් කාර්යන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. ලංකාවේ රජවරු නගර නිර්මාණයේදි ඒවායේ ආරක්ෂාව ගැන විශේෂයෙන් සැලකිලිමත් වී තිබේ. මේ බව උදාහරණ දෙකක් සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

6) i. සමාජ සුභසාධනය පිළිබඳ විශේෂ උනන්දුවක් දැක්වූ රජවරු අනුරාධපුර යුගයේ සිටියහ. එවන් රජවරු තුන්දෙනෙක් නම් කරන්න (ලකුණු 3)

ii. අතීතයේ රජවරු ශාසනික අභිවෘද්ධිය සඳහා කළ කාර්යන් හතරක් ලියන්න. (ලකුණු 4)


iii. මහා විජයබාහු රජතුමා ගැන වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 5)

7) i. දක්වා ඇති පින්තූර තුන ඔබේ පිළිතුරු පත්‍රයේ A . B, C යොදා නම් කරන්න.

(A)



(B)



(C)



(ලකුණු 3)

ii. ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම ස්ථාන අතුරින් ලෝක උරුම ලෙස නම් කර ඇති ස්ථාන 4ක් නම් කරන්න.

(ලකුණු 4)

iii. අපගේ සංස්කෘතික උරුමයන් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කර ඉන් එක් උරුමයක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 5)

The National e-learning Portal for The General Education

ප්‍රශ්න අංක 8 , 9 මුස්ලිම් පාසල් සඳහා පමණි.

ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

8)

i. පුරාණ මිනිසාගේ ජීවන රටාව ප්‍රධාන ක්ෂේත්‍ර තුනකින් සමන්විත වුණි.ඒ මොනවාද ? (ලකුණු 3)

ii. අතීත මිනිසා සත්ව පාලනය තුළින් ලබා ගත් ප්‍රයෝජන 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. හේනක් සකස් කිරිමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග තුනක් දක්වා එකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

9)

i. මෙම ස්ථාන කර වූ රජවරු නම් කරන්න.

A. පබළු වෙහෙර

B. හැටදාගෙය

C. පොත්ගුල් විහාරය (ලකුණු 3)

ii. පරාක්‍රමබාහු රජුගේ ආර්ථික සංවර්ධන කටයුතු හතරක් ලියන්න. (ලකුණු 4)

iii. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග තුනක් ලියන්න. ඉන් එකකට මුහුණ දුන් ආකාරය විස්තර කරන්න. (ලකුණු 5)

The National e-Learning Portal for The General Education